සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

972

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- .................................................... විභාග අංකය :- ..........................

## I කොටස

සැලකිය යුතුයි:

(i) ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(ii) දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා එම පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01) බුදුරජාණන් වහන්සේ ඇසිපිය නොහෙළා බෝධීන්වහන්සේ දෙස බැලීම හෙවත් අනිමිස ලෝචන පූජාව සිදුකරන ලද්දේ බුද්ධත්වයෙන් පසුව

(1) දෙවන සතියේ ය. (3) සිව්වන සතියේ ය.

(2) තෙවන සතියේ ය. (4) සයවන සතියේ ය.

(02) බිම්බිසාර රජු වේළුවනාරාමය පූජා කිරීමෙන් පසු ඥාති පිරිසක් නිමිති කොටගෙන ඔවුන්ට පින් අනුමෝදන් කිරීමේ වැදගත්කම පෙන්වා දෙමින් බුදුරජාණන්වහන්සේ දේශනා කරන ලද සූත්‍ර දේශනාව වන්නේ,

(1) කරණීයමෙත්ත සූත්‍රයයි. (3) සිගාලෝවාද සූත්‍රයයි.

(2) තිරෝකුඩ්ඩ සූත්‍රයයි. (4) දම්සක් පැවතුම් සූත්‍රයයි.

(03) බුදුරජාණන් වහන්සේ ගිලානෝපස්ථානයේ වටිනාකම ආදර්ශයෙන් ම ලොවට පෙන්වා වදාළ සේක. එවන් එක් අවස්ථාවක් වන්නේ,

(1) සෝපාකට පිහිටවීම ය. (3) පූතිගත්තිස්ස හිමියන්ට පිහිටවීම ය.

(2) පටාචාරාවට පිහිටවීම ය. (4) රජ්ජුමාලාවට පිහිටවීම ය.

(04) කරණීයමෙත්ත සූත්‍රයට අනුව මෙත් වඩන්නකු තුළ තිබිය යුතු උසස් ගුණාංග ගණනින්,

(1) 05කි. (2) 10කි. (3) 15කි. (4) 20කි.

(05) ඕනෑම සමාජයක ශිෂ්ට සම්පන්නභාවය රැකගැනීමට 'ගෘහස්ත ශීලය' ඉවහල් කරගත හැකිවේ. මෙහි ගෘහස්ත ශීලය ලෙස දක්වන්නේ,

(1) ගිහි ශීලයයි. (3) පංච ශීලයයි.

(2) අට ශීලයයි. (4) ආජීව අෂ්ටමක ශීලයයි.

(06) 'කේළාම් කීමෙන් වැළකෙමි' යන අදහස ගෙන දෙන ශික්ෂාපදය වන්නේ,

(1) ඵරුෂාවාචා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන්නයි.

(2) පිසුණාවාචා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන්නයි.

(3) මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන්නයි.

(4) මිච්ඡා ආජීවා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන්නයි.

(07) ගුරුසිත නොරිදවා - වේලාව නොවදරවා
බැති පෙම් උපදවා - අකුරු උගනී කුමරු සොඳවා මෙම පද්‍ය ඇතුළත් ග්‍රන්ථය වන්නේ,

(1) කාව්‍යශේඛරයයි. (3) ලෝවැඩ සඟරාවයි.

(2) සිරිත්මල්දමයි. (4) සුභාෂිතයයි.



140

(08) සිගාලෝවාද සූත්‍රයට අනුව ගුරුවරුන්ට සිසුන් වශයෙන් ඉටුකළ යුතු, යුතුකමක් වන්නේ,

(1) ලබාදෙන උපදෙස්වලට හොඳින් සවන් දී පිළිගැනීමයි.

(2) යහළුවන්ට හඳුන්වාදීමයි.

(3) මිත්‍රයන් සේ ඇසුරු කිරීමයි.

(4) ගුරුවරුන්ගේ පා දෝවනය කිරීම යි.

(09) දරුණු මිනිසුන් වාසය කරන සුනාපරන්තයට වැඩම කර, ඉවසීමේ ගුණය ප්‍රගුණ කළ භික්ෂූන් වහන්සේ,

(1) පූතිගත්තතිස්ස තෙරුන්වහන්සේ ය.
(2) පූර්ණ තෙරුන්වහන්සේ ය.
(3) චූල්ලතිස්ස තෙරුන් වහන්සේ ය.
(4) යස තෙරුන්වහන්සේ ය.

(10) දරුවකු තරුණයකු වීම, මහළුවීම, කෙස් සුදුවීම, දත්වැටීම වැනි ධර්මතාවයන් අයත් වන්නේ,

(1) බීජ නියාමයට ය.
(2) කම්ම නියාමයට ය.
(3) ධම්ම නියාමයට ය.
(4) චිත්ත නියාමයට ය.

(11) ජේතවනාරාමය බුදුරජාණන්වහන්සේට පූජා කරන ලද්දේ,

(1) ජේත නම් කුමරු ය.
(2) මිගාර සිටුතුමා ය.
(3) මෙණ්ඩක සිටුතුමා ය.
(4) අනේපිඬු සිටුතුමා ය.

(12) චතුරාර්ය සත්‍ය ධර්මය ඇතුළත් සූත්‍රයක් වන්නේ,

(1) දම්සක් පැවතුම් සූත්‍රයයි.
(2) කරණීය මෙත්ත සූත්‍රයයි.
(3) මහා මංගල සූත්‍රයයි.
(4) රතන සූත්‍රයයි.

(13) ආර්ය අෂ්ටාංගික මාර්ගය බෙදා දක්වූයේ,

(1) ත්‍රි ලක්ෂණයටයි.
(2) ත්‍රි ශික්ෂාවටයි.
(3) ත්‍රිකෝටිපාරිශුද්ධ ශීලයටයි.
(4) ත්‍රි විද්‍යාවටයි.

(14) බෞද්ධයාගේ අත්පොත ලෙස සැලකෙන ධම්ම පදයේ ඇතුළත් ගාථා ගණන සංඛ්‍යාවෙන්,

(1) හාරසීයකි.
(2) හාරසිය දහයකි.
(3) හාරසිය විසිතුනකි.
(4) හාරසිය තිස්තුනකි.

(15) දූරදක්නා නුවණ, පිරිස් කළමනාකරණය, විමසිලිමත්බව, නිවැරදි තීරණ ගැනීම ආදී නායකත්ව ගුණාංග රැසක් විස්තර වන ජාතක කථාව වන්නේ,

(1) අපණ්ණක ජාතක කතාවයි.
(2) සාලිකේදාර ජාතක කතාවයි.
(3) තිත්තිර ජාතක කතාවයි.
(4) අත්ථස්සද්වාර ජාතක කතාවයි.

(16) අත්තුපනායික ධර්මය පිළිබඳව සඳහන් වන සූත්‍ර දේශනාවක් වන්නේ,

(1) දම්සක්පැවතුම් සූත්‍රයයි.
(2) වේළුද්වාර සූත්‍රයයි.
(3) සිගාලෝවාද සූත්‍රයයි.
(4) කරණීය මෙත්ත සූත්‍රයයි.

(17) බුදුරජාණන්වහන්සේ තමා හමුවීමට ඒම නුසුදුසු බවද, තමන් උන්වහන්සේ හමුවට යා යුතු බව ද ප්‍රකාශ කළේ,

(1) කොසොල් මහරජතුමා ය.
(2) සුදත්ත සිටුවරයා ය.
(3) සෝණදණ්ඩ බමුණා ය.
(4) උපක ආජීවකයා ය.

(18) බෞද්ධ දරුවන් වන අප විහාරස්ථානයේ දී වන්දනා කරන අනුපිළිවෙල වන්නේ,

(1) ශාරීරික චෛත්‍යය, පාරිභෝගික චෛත්‍යය, උද්දේසික චෛත්‍යය ලෙසට ය.

(2) පාරිභෝගික චෛත්‍යය, උද්දේසික චෛත්‍යය, ශාරීරික චෛත්‍යය ලෙසට ය.

(3) උද්දේසික චෛත්‍යය, පාරිභෝගික චෛත්‍යය, ශාරීරික චෛත්‍යය ලෙසට ය.

(4) පාරිභෝගික චෛත්‍යය, ශාරීරික චෛත්‍යය, උද්දේසික චෛත්‍යය ලෙසට ය.

The National e-learning Portal for The General Education

(19) බුද්ධ දේශනාවට අනුව උපයන ධනය සමාජ යහපතට හේතුවන අයුරින් වැයකළ යුතු ආකාරය දක්වෙන සූත්‍රය වන්නේ,

(1) පත්තකම්ම සූත්‍රයයි.
(2) රාහුලෝවාද සූත්‍රයයි.
(3) ගිරිමානන්ද සූත්‍රයයි.
(4) ධම්මචක්කප්පවත්තන සූත්‍රයයි.

(20) සීල, සමාධි, ප්‍රඥා දී ගුණ ධර්ම වැඩිය හැක්කේ ක්‍රෝධය ඇති තැනැත්තාට නොව ඉවසීම ඇති තැනැත්තාට ය. සියලු කුසල ධර්මයෝ ඉවසීම මුල්කොට වැඩෙන බව දක්වෙන ගාථාවේ මුල් පදය වන්නේ.

(1) සබ්බේ තසන්ති දණ්ඩස්ස යන්න ය.
(2) සීල සමාධි පඤ්ඤානං යන්න ය.
(3) යෝගික්ඛමේ මං උපට්ඨහෙයා යන්න ය.
(4) හාස්සෙට්ට තේන පාරියෝ යන්න ය.

(ලකුණු 20 x 2 = 40)

## <u>II කොටස</u>

- **පළමු ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 16කි.**
- **අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගිනි.**

(01) (1) බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලයේ දී වැඩ සිටි බහු භාණ්ඩික භික්ෂූන් වහන්සේ නමක් පිළිබඳ පුවතක් බණ පොතෙහි සඳහන් වේ. එම භික්ෂූන් වහන්සේ කවුරුන් ද? (ලකුණු 01)

(2) භික්ෂු සමාජයේ පෞද්ගලික දේපළ අයිතියක් නැත. ඇත්තේ පොදු දේපළ අයිතියකි. එම ක්‍රමය ශාසන ව්‍යවහාරයේ පවතින්නේ කුමන නමකින් ද? (ලකුණු 02)

(3) බුදු දහමේ සමජීවිකතාවයෙන් යුතුව කටයුතු කරන පුද්ගලයින් හඳුන්වන්නේ කුමන පුද්ගලයින් ලෙස ද? (ලකුණු 02)

(4) තමන් උපයන ධනය පරිහරණය කළ යුතු ආකාරය පිළිබඳව සිගාලෝවාද සූත්‍රය තුළින් මනාව පැහැදිලි වේ. ඒ අනුව පරිභෝජනයට , ආයෝජනයට හා ඉතිරි කිරීමට ධනය වෙන් කළ යුතු අයුරු අනුපිළිවෙළින් දක්වන්න. (ලකුණු 03)

(5) භික්ෂූන් වහන්සේලා සිවුරු පරිහරණය කිරීමේ දී දක්වන අරපිරිමැස්ම පිළිබඳව ආනන්ද හිමියන් විසින් උදේනි රජතුමාට දේශනා කරන ලද කරුණු මොනවා ද? (ලකුණු 04)

(6) නොමිලේ ඔබට ලැබෙන පෙළ පොත් සුරක්ෂිතව පරිහරණය කිරීම සඳහා ඔබ අනුගමනය කරන ක්‍රියා මාර්ග හතරක් ලියන්න. (ලකුණු 04)

(02) (1) ධම්ම පද ග්‍රන්ථය අයත්වන පිටකය හා නිකාය පිළිවෙළින් ලියන්න. (ලකුණු 02)

(2) අක්කොච්ඡි මං අවධි මං
අජිනි මං අහාසි මේ
යේ තං උපනය්හන්ති
වේරං තේසං න සම්මති යන ගාථාවෙහි අර්ථය ලියන්න. (ලකුණු 03)

(3) ඉහත ධම්ම පද ගාථාව ආදර්ශයට ගනිමින් අපේ ජීවිත ඒ අනුව හැඩ ගස්වා ගැනීමට අවශ්‍ය උපදෙස් හයක් ලියන්න. (ලකුණු 06)

(03) (1) 'සිංහලේ දෙවන මහ කව' යනුවෙන් නම් ලද කෘතිය කුමක් ද? (ලකුණු 02)

(2) දොළොස් පුණ්‍ය ක්‍රියා හඳුන්වා දෙන පැදි පෙළට අයත් 'දන්සිල් බාවනා' යන කවියෙහි ඉතිරි පද තුන සම්පූර්ණ කරන්න. (ලකුණු 03)

(3) ඉහත සඳහන් කවියෙහි දැක්වෙන පුණ්‍ය ක්‍රියා ඔබගේ ජීවිතය සාර්ථක කර ගැනීමට යොදා ගත හැකි ආකාරය පහදන්න. (ලකුණු 06)

(04) (1) බුදු දහමේ දැක්වෙන බහු හේතුවාදී වීම හඳුන්වනුයේ කුමන නමකින් ද? (ලකුණු 02)

(2) බෞද්ධයන් වන අප කර්මය හා විපාකය පිළිගත යුතු වේ. එහෙත් කර්මය වෙනස් කර ගත හැකි බව ද බුදු දහමේ දැක්වේ. කර්මය වෙනස් කිරීමට ඔබ විසින් වර්ධනය කර ගත යුතු ගුණ ධර්ම තුනක් නම් කරන්න. (ලකුණු 03)

(3) ඔබේ මිතුරාගේ සීයා මිය යාම නිසා මිතුරා දුකට පත් වී සිටියි. ඔහුට මරණයෙහි යථා තත්වය අවබෝධ කර දී පෙර පරිදි එදිනෙදා කටයුතු කර ගැනීමට ලබා දිය හැකි උපදෙස් හයක් ලියන්න. (ලකුණු 06)

(05) (1) සංඝමිත්තා තෙරණින් වහන්සේ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ රැගෙන ලක්දිවට වැඩම කරවන ලද්දේ කිනම් පොහෝ දිනයක දී ද? (ලකුණු 02)

(2) ත්‍රිවිධ චෛත්‍යය මූලික කරගෙන ඇති වූ පුද පූජා ක්‍රම තුනක් ලියන්න. (ලකුණු 03)

(3) අතීත උරුම ආරක්ෂා කිරීමට අප කළ යුතු වන්නේ මොනවා දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06)

(06) (1) සිරුරට අධික සැප සම්පත් ලබා දෙන අන්තගාමී පිළිවෙත නම් කරන්න. (ලකුණු 02)

(2) ආර්ය අෂ්ටාංගික මාර්ගයට අයත් මාර්ගාංග තුනක් ලියන්න. (ලකුණු 03)

(3) චතුරාර්ය සත්‍යය ඉගෙන ගැනීමෙන් එදිනෙදා ජීවිතයේ දී අපට ලබා ගත හැකි ප්‍රයෝජන මොනවා ද? (ලකුණු 06)

(07) පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් තෝරාගෙන ඒ පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(1) පංච ශීලය
(2) මෛත්‍රී භාවනාව
(3) විශාඛා මහා උපාසිකාව
(4) නව අරහාදී බුදුගුණ

(ලකුණු 11)

The National e-learning Portal for The General Education